


# නොදැවී වසර විසිපහක් වොයිස් ඔෆ් ලංකා සමග රංජිත් - රූබි

වසර විස්සක් තරම් දිග කාලයක් ප්‍රජා ගුවන් විදුලි සේවාවක් පවත්වාගෙන යාම අතිශය දුෂ්කර කාර්යයක් බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. එවන් දුෂ්කර කාර්යයක ඉතා සාර්ථකව නිරතව සිටින රංජිත් සහ රූබි වික්‍රමසිංහ යුවළ මෙල්බන් ශ්‍රී ලාංකික ප්‍රජාවේ මහත් සැළකිල්ලට පාත්‍රව සිටිති. ඔවුන් සෑම ඉරිදාවකම රාත්‍රි 8 සිට 11 දක්වා ඉදිරිපත් කරන වොයිස් ඔෆ් ලංකා ගුවන් විදුලි නැඩසටහන වසර 25ක් පුරා මෙල්බන් ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙන් කරන සේවය අතිමහත් ය. ඔවුන් ගේ ඒ ගමන පිළිබඳ සාකච්ඡා කරන්නට සන්නස රංජිත් වික්‍රමසිංහ මහතා හමුවූ අවස්ථාවේ කළ සාකච්ඡාවේ සටහනයි මේ.

**වොයිස් ඔෆ් ලංකා ගුවන් විදුලි සේවය ආරම්භ කළේ කොහොමද?**

මම ඒ කාලෙ මෙල්බන් 3ZZZ ගුවන් විදුලියට සම්බන්ධව හිටියා. එහි යම් යම් වැඩ සටහන් සඳහා පටිගත කිරීම් වලින් මම සහය වුණා. ඒ අත්දැකීම නිසා ගුවන් විදුලිය කෙරෙහි ආසාවක් ඇතිවුණා. ඒ අනුව තමයි වොයිස් ඔෆ් ලංකා ගුවන් විදුලිය ආරම්භ කළේ. ඒ මෙයට අවුරුදු විසි පහකට කලින්..



**වොයිස් ඔෆ් ලකා ආරම්භ කරන විට එහි පෙළගැස්ම ගැන ඔබේ අදහස වෙලා තිබුණේ මොකක්ද?**

මම හිතුවෙ ඒ වන විට පැවතුණ ගුවන් විදුලි සේවාවන්ට වඩා වෙනස් විදිහක සේවාවක් ආරම්භ කරන්න.. අසන්නන් සමග වඩාත් සමීප වෙමින් ඔවුන්ට සරළ වින්දනයක් ලබා දෙන්න අපි උත්සාහ කළා.. මම විශ්වාස කරන දෙයක් තමයි ඕනෙම මාධ්‍යයක් සාර්ථක වෙන්න නම් අසන්නනන් සමග සමීප සම්බන්ධතාවක් පවත්වගෙන යා යුතු බව..

මුලින්ම අපි පටන් ගත්තේ පැය බාගයක වැඩ සටහනක් හැටියට.. අසන්නන්ගෙ ඉල්ලීම වැඩි වෙනකොට පැයක් වුණා.. දැන් අපි පැය තුනක් කරනවා.. පැය තුනකට වඩා අපේ වැඩ සටහනේ කාලය දික්කරන්න මම හිතන්නෙ නැහැ..

අපේ ගමනේ සාර්ථකත්වයත් එයයි.. ඒ විතරක් නෙවෙයි.. අපි මේ මෙල්බන්හි ප්‍රජා සංවිධාන වෙළඳ ආයතන ආගමික ස්ථාන වැනි සියලූ ආයතන වලටත් සෑම විටම අත හිත දීලා තියෙනවා..

**එදා වසර විසිපහකට පෙර තිබුණ ගුවන් විදුලි තාක්ෂණයත් අද තියෙන තාක්ෂණයත් බොහෝ වෙනස්.. මේ වෙනසට ඔබ මුහුණ දුන්නෙ කොහොමද?**

මම එදා ඉඳන්ම තාක්ෂණයට සමීපව හිටිය කෙනෙක්. මුලදි අපි කැසට් පටි වලින් ගීත වාදනය කළා. ඉන්පස්සේ සී ඩී තැටි වලට ආවා.. අද වන විට කෙලින්ම පරිගණකයෙන් ගීත වාදනය කරන තත්වයට පත්වෙලා තියෙනවා.. පියවරෙන් පියවර මේ විදිහට ඉදිරියට එන්න මට කිසිම බාධාවක් ඇතිවුණේ නැහැ..

**මේ ආ ගමනෙදි ඔබට මතුවුණ ගැටලූ මොනවද?**

ගුවන්විදුලිය සම්බන්ධයෙන් නම් මට කිසිම ගැටලූවක් කවදාවත් ඇති වෙලා නැහැ.. මොකට අපි හැමදෙනා එකක්ම සුහදව යන ගමනක් මේක.. මාත් රූබිත් මේ ගුවන් විදුලිය කරන්නෙ හරිම සතුටින්.. මෛක්‍රෆෝනය ඉදිරියෙ වාඩි වුණාට පස්සෙ අපට කාලය යනවාවත් දැනෙන්නෙ නැහැ..

**ඔබ වොයිස් ඔෆ් ලංකා වැඩ සටහන ඉදිරිපත් කරන්න පෙර සූදානම් වෙන්නෙ කොහොමද?**

අපි ඉරිදා දවස සම්පූර්ණයෙන්ම වෙන් කරලා තියෙන්නෙ අපේ වැඩ සටහනට සූදානම් වෙන්නයි. එදාට තමයි අපට විවිධ සමාජ ආයතන වලින් සමාජ නිවේදන පවා එවන්නෙ.. ඉරිදට අපි කොහෙවත් යන්නෙවත් නැහැ.. අනෙක් කාරණය තමයි අපි අපේ වැඩ සටහන සජීවීව තමයි ඉදිරිපත් කරන්නෙ.. ඒ නිසා පටිගත කිරීම් වැනි දේ කරන්න අපට සිදුවෙන්නෙ නැහැ..



**මේ ගමනේ ආපසු හැරිලා බලනකොට ඔබට සිහිපත් වන අය කවුද?**

ගොඩක් අය සිහිපත් වෙනවා.. වජිර ඒකනායක දොස්තර ඔල්ගා මෙන්ඩිස් වැනි අය අපට දුන් සහය අමතක වෙන්නෙ නැහැ..

**වසර විසි පහක් ඔබ දෙදෙනා මේ ආකාරයට වැඩ සටහනක් කිරීම ලෝක වාර්තාවක් වෙන්න පුලූවන්**

ඔව්.. ඇත්තටම මේක ලෝක වාර්තාවක්.. අපි ඒ ගැන සොයා බැලූවා.. ලෝකයේ කොහෙවත් අඹු සැමි යුවලක් වසර විසිපහක් ගුවන් විදුලි වැඩ සටහනක් කරලා නැහැ.. ඒත් ඒක ගැන ලොකුවට කතා කරන්න අපි උත්සාහ ගත්තෙ නැහැ..

**ලෝකයේ හැම පැත්තකම ඔබේ අසන්නන් ඉන්නවා?**

ඔව්.. ලෝකයේ විවිධ රටවල සිට අපට සවන් දෙන අය ඉන්නවා.. මොකද දැන් අපේ වැඩ සටහන www.3ser.org.au වෙබ් අඩවිය ඔස්සේ සවන් දිය හැකි නිසා..

**ඉතින් හෙට දවසේ ඔබ කරන්න බලාපොරොත්තු වෙන්නෙ මොකක්ද?**

අපේ අරමුණ හැකි තරම් කාලයක් මේ වැඩ සටහන පවත්වාගෙන යන එක තමයි. ඉදිරියේදී පොඩි පොඩි වෙනස් කම් කරන්නත් හිතාගෙන ඉන්නවා. අපේ ගමන යන්නට අපේ අසන්නන්ගෙ සහයෝගයත් දෙවියන්ගේ ආශිර්වාදයත් ලැබෙන බව අපි දන්නවා.

